## කොළඹ විශ්වවිද්‍යාලය - ශ්‍රී ලංකාව

## ශාස්ත්‍ර පීඨය

### ශාස්ත්‍රවේදී සිව්වන වසර පරීක්ෂණය - දෙවන සෙමෙස්තරය – 2017/2018

### SOC 4272 – සංවර්ධනය පිළිබඳ සමාජ විද්‍යාව

පැ දෙකයි (02)

**ප්‍රශ්න <u>තුනකට (03)</u> පමණක් පිළිතුරු සපයන්න.**

---

1. 'සංවර්ධනය යන්න ආර්ථික සංවර්ධනය ලෙස පමණක් නිර්වචනය කළ නොහැකි නමුත් ආර්ථික සාධක සංවර්ධනයෙහි වඩාත්ම වැදගත් කාර්යභාරයක් ඉටු කරයි'. මෙම ප්‍රකාශ සාකච්ඡා කරන්න.

2. 'ඩබ්ලිව්. ඩබ්ලිව්. රොස්ටෝව් (W.W. Rostow) ගේ ආර්ථික සංවර්ධනය පිළිබඳ පියවර න්‍යාය ධනේශ්වර සංවර්ධන රටාව පිළිබඳව මාක්ස්වාදී විශ්ලේෂණයට විවේචනයක් ඉදිරිපත් කරයි'. විචාරාත්මකව සාකච්ඡා කරන්න.

3. ඒ. ජී. ෆ්‍රෑන්ක්ගේ 'පරායත්තතා න්‍යාය' සංවර්ධනය වෙමින් පවතින රටවල් සමාජ ආර්ථික සහ දේශපාලන සංකීර්ණතා තේරුම් ගැනීම සඳහා කොතෙක් දුරට උපකාරකර ගත හැකිද යන්න උදාහරණ සහිතව විවේචනාත්මකව සාකච්ඡා කරන්න.

4. 'සංස්කෘතික හා දේශපාලන ගෝලීයකරණය යනු සමස්ත ලෝකයම ඇමරිකානුකරණයට ලක් කිරීමේ ක්‍රියාවලියකි'. මෙම ප්‍රකාශය විවේචනාත්මකව විමසන්න.

5. 'ලෝකයේ සංවර්ධිත හා සංවර්ධනය වෙමින් පවතින රටවල් අතර පවතින සම්බන්ධතා තේරුම් ගැනීම සඳහා ඉම්මැනුවල් වොලස්ටීන්ගේ ලෝක පද්ධති න්‍යාය වඩාත් යෝග්‍ය න්‍යායික ප්‍රවේශයකි.' විභාග කරන්න.

6. පහත සඳහන් මාතෘකා අතුරින් ඕනෑම **<u>දෙකක් (02)</u>** පිළිබඳ කෙටි රචනා ලියන්න.

   i නවීකරණය

   ii නව කාර්මික රටවල්

   iii සංවර්ධනයේ දී කාන්තාවගේ කාර්යභාර්ය

***************